අපි නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා වෙනුවෙන් එතුමාගේ කිරි පංගුව වෙන් කර තබන්නන් වූයෙමු. එවිට එතුමා රාත්රියෙහි පැමිණෙයි. පසුව නිදන්නෙකු අවදි නොකරන අයුරින් හා අවදිව සිටින්නන්ගේ කණට වැකෙන අයුරින් සලාම් පවසයි.

අපි නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා වෙනුවෙන් එතුමාගේ කිරි පංගුව වෙන් කර තබන්නන් වූයෙමු. එවිට එතුමා රාත්රියෙහි පැමිණෙයි. පසුව නිදන්නෙකු අවදි නොකර, අවදිව සිටින්නන්ගේ කණට පමණක් වැකෙන අයුරින් සලාම් පවසයි. එවිට ඔහු ද නබි -සල්ලල්ලාහු
අලය්හි වසල්ලම්- තුමා වෙත පැමිණ එතුමාණන් සලාම් කියූ අයුරින් සලාම් පැවසීය.
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් මුස්ලිම් එය වාර්තා කර ඇත]

මික්දාද් තුමා හා ඔහු සමග සිටි මිතුරෝ -රළියල්ලාහු අන්හුම්- එළු කිරි දොවා ඔවුන්ගේ කිරි පංගුව පානය කොට, සල්ලල්ලාහු අලය්හි වසල්ලම් තුමා පැමිණ එය පානය කරන තෙක් එතුමාගේ පංගුව වෙන් කර තබති. පසුව ඔවුන් රාත්රියේ නිදාගෙන සිටියදී එතුමාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- ඔවුන් වෙත පැමිණ හඬ උස් නොකර, පහත් හඬින් ඔවුනට සලාම් පැවසූහ. එය නිදන්නා අවදි කරවන අයුරින් නොවීය. එමෙන්ම එය ඔවුන් අතුරින් අවදිව සිටින්නාට ඇසෙන්නට තරම් විය.

http://www.sunnah.global/hadeeth/si/show/3757